## නිපුණතාවය 4 - යෝග්‍ය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පූර්ව සූදානම ප්‍රදර්ශනය කරයි.

## නිපුණතා මට්ටම - නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී වෙළෙඳපොළට පිවිසිය හැකි විකල්ප ක්‍රම සහ මාර්ග විමසයි.

**(පෙළ පොතේ පිටු අංක 83 - 86 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.)**

01) නව ව්‍යවසායකයාට වෙළෙඳපොළට ප්‍රවේශ වීම සඳහා අනුගමනය කළ හැකි විකල්ප ක්‍රම 4කි. ඒවා නම් කරන්න.

02) ඔබ ඉහතින් දැක්වූ එක් එක් ක්‍රමය සඳහා නිදසුන් 2 බැගින් වෙන වෙනම ලියන්න.

03) පවතින වෙළඳපොළකට පවතින භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීමේදී අත් විඳීමට සිදු වන අවාසි 2ක් දක්වන්න.

04) නව වෙළඳපොළකට පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීමේදී මතුවන වාසියක් සහ අවාසියක් ලියන්න.

05) නව භාණ්ඩයක් හෝ සේවාවක් පවත්නා වෙළඳපොළට ඉදිරිපත් කිරීමේදී වෙළෙඳපොළ ජය ගැනීමට නම් ව්‍යවසායකයා සිදු කළ යුත්තේ කුමක්ද ?

06) නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළකට සැපයීමේදී ව්‍යවසායකයෙකුට අත් විඳීමට සිදු වන ප්‍රධාන වාසිය හා අවාසිය නම් කරන්න.

07) නව නිෂ්පාදිතයක් ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවසායකයෙකුට භාවිතා කළ හැකි SCAMPER ආකෘතියෙන් ඉදිරිපත් කෙරෙන නිෂ්පාදන නව්‍යකරණ ක්‍රම 7 නම් කරන්න.

08) ඉහතින් ඔබ දැක්වූ නිෂ්පාදන නව්‍යකරණ ක්‍රම නිදසුනක් සමගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

09) පිටු අංක 87 හි සඳහන් ක්‍රියාකාරකම් 03 සඳහා පිළිතුරු සපයන්න.